# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2098/21 – 2018 නොවැම්බර් 21 වැනි බදාදා – 2018.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ මැදසියපත්තුව සුළු කොට්ඨාසයේ, උකුවෙල (ඊ 355) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උකුවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඒ/යුකේඩබ්ලිව්/2017/599 හා 2018.01.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – උකුවෙලවත්ත සහ මාරුකොනවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1522 ක් පමණ**

උතුරට: කේ. බී. ජිනදාස හිමිකම් කියන උකුවෙලවත්ත, මාරුකොනවත්ත, කේ. බී. ජේ. සී. ජිනදාස හිමිකම් කියන උකුවෙලවත්ත, මාරුකොනවත්ත සහ පුබුදු මාවත; නැගෙනහිරට: තුසිත පිළිමතලාව සහ තවත් අය හිමිකම් කියන උකුවෙලවත්ත සහ මාරුකොනවත්ත; දකුණට: තුසිත පිළිමතලාව සහ තවත් අය හිමිකම් කියන උකුවෙලවත්ත, මාරුකොනවත්ත සහ මාර්ග (මා.සං.අ.); බටහිරට: ආර්. එම්. සී. රණසිංහ හිමිකම් කියන උකුවෙලවත්ත, මාරුකොනවත්ත, කේ. බී. ජිනදාස හිමිකම් කියන උකුවෙලවත්ත, මාරුකොනවත්ත සහ කේ. බී. ජේ. සී. ජිනදාස හිමිකම් කියන උකුවෙලවත්ත, මාරුකොනවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/ඩබ්ලිව්එස්/345.
2018 අගෝස්තු මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 – 73